මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 3 කොටසේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 අගෝස්තු 11 දින එළඹි අංක 3348 සහ 3349 දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

ණය ගිවිසුම්වලට අනුව එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කිලෝමීටර 29.4 ක මලාපවහන ජාල එලීම සහ පොම්පාගාර 3 ක් ඉදිකිරීම ඇතුළුව දකුණු පෝෂක ප්‍රදේශයේ අපජල පවිත්‍රාගාර පුනරුත්තාපනය සහ පුළුල් කිරීම සහ ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා සේවා සපයන්නන්ගේ ධාරිතා වර්ධනය වැඩ සටහනේ අරමුණ වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 16,401.76 කට සමාන එජඩො මිලියන 112.83 ක් වූ අතර ඉන් රු.මිලියන 13,471.16 කට සමාන එජඩො මිලියන 92.67 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 2,930.60 කට සමාන එජඩො මිලියන 20.16 ක් ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. වැඩසටහන එහි කාර්යයන් 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

වැඩසටහනේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ණය පොළිය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගය සහ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල දැක්වෙන අගය අතර වෙනසක් නිරීක්ෂණය විය. | 81,166,834 | වඩාත් සුදුසු ආකාරයට පොළී පිරිවැය වෙන් කිරීමට ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය සහ භාණ්ඩාගාරය සමග පියවර ගනු ලැබේ. | විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර වෙනස හඳුනා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37ට අනුව කොන්ත්‍රාත්කරු විසින් හිමිකම් පාන ලද ප්‍රමාද ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම අවශ්‍ය වුවද, මූල්‍ය ප්‍රකාශවල එය හෙළිදරව් කර නොතිබුණි. | **257,171,849** | ඔවුන් බලාපොරොත්තු වන ආකාරයට ඕනෑම මුදලක් ඉල්ලීමට කොන්ත්‍රාත්කරුට අයිතියක් ඇත. කෙසේවෙතත්, නිතරම සියළුම ඉල්ලීම් සඳහා සේවායෝජක වගකීමට බැඳෙන බව එමගින් අදහස් නොකෙරේ. | මෙම අවශ්‍යතා සමග අනුකූල වීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**2.2** නීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම

| | නීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2019** මාර්තු **05** දිනැති අංක **2019/01** දරණ කළමණාකරන සේවා චක්‍රලේඛයේ **9.3** වගන්තිය | සමාලෝචන කමිටු මාස **02** කට වරක් පැවැත්විය යුතු වුවද **2020** වර්ෂය තුළදී සමාලෝචන කමිටු රැස්වීම් **02**ක් පමණක් පවත්වා තිබුණි. | **2020** මාර්තු මස සිට පැවති තත්ත්වය නිසා කොවිඩ් තත්ත්වය වලක්වාලීම පිළිබඳ මාර්ගෝපදේශ වලට අනුගතවෙමින් එවැනි කණ්ඩායම් සඳහා රුස්වීම් සංවිධානයට නොහැකි විය. | විකල්පයක් ලෙස මාර්ග ගත රැස්වීම් පැවැත්වීම කළ යුතුව තිබුණි. |
| (ආ) | **2019** මාර්තු **05** දිනැති අංක **2019/01** දරණ කළමණාකරන සේවා චක්‍රලේඛයේ **4.2.3** වගන්තිය | රාජ්‍ය සේවයට බාහිරින් බඳවා ගන්නා ලද සහය කාර්යය මණ්ඩලයේ වැටුප් රාජ්‍ය සේවයේ එම තනතුරේ බඳවා ගැනීමේ මට්ටමේ ආරම්භක පියවරේ වැටුප් පරිමානය මත පදනම් විය යුතුය. කෙසේවෙතත්, එම්එන්1 – **2006** ආරම්භක වැටුප් පරිමාණය වෙනුවට ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඩී පරිමානය පදනම්ව **2011**දී දත්ත සැකසුම්කරුවෙකු බඳවාගෙන තිබුණි. | මෙම වැටුප් පරිමාණය මත පත්වීම් සිදුකර ඇති අතර ඒ අනුව ගෙවීම් සිදුකර ඇත. | රීති සහ රෙගුලාසි සමග අනුකූල වීම අවශ්‍ය වේ. |

**3.** භෞතික කාර්යසාධනය

**3.1** ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| | සංරචකය | ක්‍රියාකාරකම් | **2020** දෙසැම්බර් **31** දිනට | | විගණන ගැටළු | ප්‍රමාදයන් සඳහා හේතු |
|---|---|---|---|---|---|---|
| | | | අපේක්ෂිත කාර්යසාධනය ප්‍රතිශතය | ලගාකරගත් කාර්යසාධනය ප්‍රතිශතය | | |
| (අ) | කිරුළපන පෝෂක ප්‍රදේශය සඳහා | කිරුළපන පෝෂක ප්‍රදේශය සඳහා නව ගුරුත්වාකර්ෂණ | **100** | **54** | කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී භෞතික ප්‍රගතිය, අවශ්‍ය | කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී භෞතික ප්‍රගතිය, අවශ්‍ය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | නව ගුරුත්වාකර්ෂණ මලාපවහන ජාලයක්, පීඩන මධ්‍යස්ථාන සහ පොම්පාගාර ඉදිකිරීම | මලාපවහන ජාලයක්, පීඩන මධ්‍යස්ථාන සහ පොම්පාගාර ඉදිකිරීම. | | | සම්පත් නොයෙදවීම සහ දුර්වල සැලසුම්කරණය සහ කොන්ත්‍රාත්කරුට තලකොටුව වත්ත භාරදීමේ ප්‍රමාදයන් නිසා ප්‍රමාදයන් සිදුවී තිබුණි. | සම්පත් නොයෙදවීම සහ දුර්වල සැලසුම්කරණය |
| (ආ) | වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම | වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම | 100 | 75 | ලංසුකරුවන්ගෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් පැහැදිලි කර ගැනීම් ගණනාවක් ලැබීම හේතුවෙන් ප්‍රමාදය සිදුවී තිබුණු අතර ආසියානු සංවර්ධන බැංකුවේ එකගතාවය සහ කැබිනට් අනුමැතිය අතර වර්ෂයක ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයන් |
| (ඇ) | කිරුල - නාරාහේන්පිට ප්‍රදේශය සඳහා මලාපවහන පහසුකම් සැපයීම | කිරුල - නාරාහේන්පිට ප්‍රදේශය සඳහා මලාපවහන පහසුකම් සැපයීම. | 100 | 75 | පොම්පාගාර 02 ක ඉදිකිරීම් සඳහා ඉඩම් නොමැති වීම හේතුවෙන් ප්‍රමාදයන් සිදුවී ඇති අතර මෙම ප්‍රමාදය ලංසු ලියවිලි සකස් කිරීම සඳහා බලපා තිබුණි. 2020 නොවැම්බර් 18 දින ලංසු ලියවිලි සඳහා EIB එකගතාවය ලැබී තිබුණි. | ඉඩම් නොමැතිවීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම. |
| (ඇ) | දකුණු පෝෂක ප්‍රදේශයේ දෝෂ සහිත මලාපවහන අළුත්වැඩියාව සහ අඩු ධාරිතාවයෙන් | දකුණු පෝෂක ප්‍රදේශයේ දෝෂ සහිත මලාපවහන අළුත්වැඩියාව සහ අඩු ධාරිතාවයෙන් යුත් මලාපවහන ඉහල නැංවීමේ සහ | 100 | 75 | ඉහල මට්ටමේ අඩු ප්‍රමුඛතාවය සහ කොන්ත්‍රාත්තුවේ විෂය පථය පිළිබඳ අවසන් නිගමනයකට නොමැතිවීම | ඉහල මට්මේදී අඩු ප්‍රමුඛතාවයක් ලබා දීම සහ කොන්ත්‍රාත්තුවේ විෂයපථය පිළිබඳව අවසන් නිගමනයකට |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | යුත් මලාපවහන ඉහල නැංවීමේ සහ ක්‍රියාත්මක කිරීම. | ක්‍රියාත්මක කිරීම. | | | හේතුවෙන් ප්‍රමාදයන් සිදුවී තිබුණි. 2020 නොවැම්බර් 18 දින ලංසු ලියවිලි සඳහා යුරෝපීය ආයෝජන බැංකුවේ එකගතාවය ලැබී තිබුණි. | නොඑළඹීම. |
| (ඉ) | පොල්වත්තේ සිට බම්බලපිටිය දක්වා මිලිලීටර 1200ක කොන්ක්‍රීට් බදක් සහිත මලාපවහන ජාලය ඉදිකිරීම. | පොල්වත්තේ සිට බම්බලපිටිය දක්වා මිලිලීටර 1200ක කොන්ක්‍රීට් බදක් සහිත මලාපවහන ජාලය ඉදිකිරීම. | 100 | අත්හැර ඇත. | ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම සහ වරාය නගර ඉඩම් ගොඩකිරීමේ වැඩසටහන මගින් අපේක්ෂිත විෂය පථය වෙනස්වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව අහෝසි කර ඇත. | ප්‍රමාණවත් අරමුදල් නොමැති වීම. |
| (ඊ) | ආයතනික ව්‍යුහය සහ සේවා සපයන්නාගේ ධාරිතාවය ශක්තිමත් කිරීම | (අ) කොළඹ නගර සභාව තුල අපජල ඒකකයක් පිහිටුවීම.<br>(ආ) GIS පදනම් කරගත් වත්කම් කළමණාකරන පද්ධතියක් ස්ථාපනය<br>(ඇ) කොළඹ නගර සභාවේ කාර්යය මණ්ඩලයේ සහ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම.<br>(ඇ) පුරවැසියන් අතර අපජල තදබදය පිළිබද දැනුවත් කිරීම සහ ගැහැණු හා පිරිමි අතර වගකීම් බෙදා ගැනීම.<br>(ඉ) පුහුණුව හා ධාරිතා වර්ධනය (CMC පවාහන අංශයේ) | 100 | 29 | 2020 දෙසැම්බර් 31 දින තෙක් කටයුතු නිමකර නොතිබුණි. | දුර්වල සැලසුම්කරණය සහ ඉහළ මට්ටමේදී අඩු ප්‍රමුඛතාවයක් ලබාදීම. |

| | |
|---|---|
| කළමණාකරනයේ ප්‍රතිචාරය | කිරුළපන පෝෂක ප්‍රදේශය සඳහා නව ගුරුත්වාකර්ෂණ මලාපවහන ජාලයක් ඉදිකිරීම, පීඩන මධ්‍යස්ථාන සහ පොම්පාගාර 2ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්වල අඩු භෞතික ප්‍රගතියක් සහ අඩු මූල්‍ය උපයෝජනයක් සඳහා කොන්ත්‍රාත්කරු සම්පත් නොයෙදවීම සහ දුර්වල සැලසුම්කරණය බලපා තිබුණි. හේතූන් ගණනාවක් නිසා ADB එකගතාවය ලබා ගැනීමෙන් පසු වර්ෂයක ප්‍රමාදයක් සිදු විය. |
| විගණකගේ නිර්දේශය | ව්‍යාපෘති කාලපරිච්ඡේදය ඉකුත්වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන ගැටළු | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| (අ) කිරුළපන මලාපවහන ජාලය සහ පොම්පාගාර 2ක් ඉදිකිරීම | | |
| (i) 2017 මැයි 04 වන දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන්කර ඇති අතර 2020 මැයි 04 මුල් අවසන් කිරීමේ දිනය වේ. පොම්පාගාර දෙකක් ඉදිකිරීම සඳහා මෙම කොන්ත්‍රාත්තුවට ඉඩම් 02 ක් අවශ්‍ය වේ. කෙසේවෙතත්, 2020 ජූනි 08 දින කොන්ත්‍රාත්කරු වෙත තලකොටුව ඉඩම භාරදී ඇත. | පවුල් 3ක් ඉවත් කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවී ඇත. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය ඉකුත්වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ii) කෙසේවෙතත්, වැඩබිම නොමැති වීම හේතුවෙන් සිදුවූ ප්‍රමාදය නිසා කොන්ත්‍රාත්කරු පාඩු ආවරණය කර ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 14 දින රු.257,171,849 ක හිමිකම්පෑමක් සිදුකර තිබුණි. | ඔවුන් බලාපොරොත්තු වන ආකාරයට ඕනෑම මුදලක් ඉල්ලීමට කොන්ත්‍රාත්කරුට අයිතියක් ඇත. කෙසේවෙතත්, නිතරම සියළුම ඉල්ලීම් සඳහා සේවායෝජක වගකීමට බැඳෙන බව එමගින් අදහස් නොකෙරේ. | |
| (iii) ශක්‍යතා අධ්‍යයන වාර්තා නොමැතිවීම සහ විස්තරාත්මක සැලැස්ම සහ ලංසු ලියවිලි ක්‍රියාවලිය ප්‍රමාදය හේතුවෙන් PMU ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට වඩා වැඩි මුදලක් රු.9,840,400(60%) රු.25,000,000 ඉඩම මිලදී ගැනීම සඳහා 2020 පෙබරවාරි 10 දින ගෙවා තිබුණි. | ඉඩම මිලදී ගැනීම සඳහා හේතුව විස්තරාත්මක සැලැස්ම හෝ ලංසු ලියවිලි සකස් කිරීමේ ප්‍රමාදය හා සම්බන්ධ නොවේ. | |
| (ආ) වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම | | |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සමස්ථ සැලැස්මට අනුව, කොන්ත්‍රාත්තුව 2017 දෙවන කාර්තුවේදී ප්‍රදානය කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 18 දින ප්‍රදානය කර තිබුණි. | සාගර පරිසරය තුලට පිරිසිදු කල අපජලය මුදා හැරීම පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශ සංශෝධනය හේතුවෙන් ලංසු ලියවිලි කටයුතු නිම කිරීම සඳහා අපේක්ෂා කල කාලයට වඩා වැඩි කාලයක් ගෙන ඇත. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය ඉකුත්වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| (ඇ) කිරුල - නාරාහේන්පිට ප්‍රදේශය සඳහා මලාපවහන පහසුකම් සැපයීම | | |
| (i) සමස්ථ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, ඉදිකිරීම් කටයුතු **2018** දී නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ලංසු ලියවිලි සඳහා **EIB** එකගතාවය **2020** නොවැම්බර් **18** දින ලැබී තිබුණි. | ව්‍යාපෘතිය පොම්පාගාර **2** ක ඉදිකිරීම සඳහා ඉඩම් නොමැතිවීම හේතුවෙන් කිරුළ - නාරාහේන්පිට මලාපවහන ජාලයේ සැලසුම්වල වෙනස්කම් කිහිප වතාවක් සිදුකිරීම සිදුවිය. ලංසු ලියකියවිලි සකස් කිරීම සහ සමසථ ප්‍රසම්පාදන ක්‍රියාවලියම ප්‍රමාද වීමට එය ප්‍රධන හේතුවක් විය. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය ඉකුත්වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ii) පොම්පාගාර **2** ක සඳහා ඉඩමක් නොමැති වීම හේතුවෙන් සැලැස්ම කිහිපවතාවක් වෙනස්කර තිබුණි. | | |
| (ඉ) පොල්වත්තේ සිට බම්බලපිටිය දක්වා කොන්ක්‍රීට් බදක් සහිත මලාපවහන ජාලය ඉදිකිරීම | | |
| අරමුදල් ප්‍රමාණවත් නොවීම සහ සමුද්‍රීය නගර සඳහා ඉඩම් ගොඩකිරීම ව්‍යාපෘතිය සමග අපේක්ෂිත විෂය පථය වෙනස්වීම හේතුවෙන් මිලිමීටර් **1200** කොන්ක්‍රීට් බදක් ඉදිකිරීම නවතා දමා තිබුණි. | සංවර්ධන ප්‍රතිපත්තීන්වල වරින්වර සිදුකරනු ලබන වෙනස් වීම් හේතුවෙන් මෙවැනි පිරිවැය ඇතිවීම වැළක්විය නොහැක. | නිසි ව්‍යාපෘති සැලසුම්කරණයක් මගින් මෙම පිරිවැය අවම කරගත යුතුය. |

**3.3 ඌන උපයෝජිත සම්පත්**

| විගණන ගැටළු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| මහා භාණ්ඩාගාරය **2017** මැයි **15** දින සිට **2020** නොවැම්බර් **15** දින දක්වා **OCR** ණය මුදලේ ලබා නොගත් ණය ශේෂය මත රු. **121,116,614**ක බැදීම් ගාස්තු ගෙවා තිබුණි. | බැදීම් ගාස්තු පිරිවැය වැලැක්විය නොහැක. ණය වියපැහැදම් වීමේ ප්‍රමාදය හේතුවෙන් අමතර පිරිවැයක් දැරූ බව එකගවේ. කෙසේවෙතත්, බැදීම් ගාස්තු ගෙවීම් කටයුතු වල විෂය පථය සීමා කිරීමට හෝ ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට බලපානු නොලැබේ. | නිසි ව්‍යාපෘති සැලසුම්කරණයක් මගින් මෙම පිරිවැය අවම කරගත යුතුය. |

**3.4 පාරිසරික කරුණු සම්බන්ධ ගැටලු**

| විගණන ගැටළු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| **2018** ඔක්තෝබර් **22** දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘතියේ පරිසර නිලධාරියා පුරප්පාඩුව පැවතුණු අතර **202** දෙසැම්බර් **31** දින තෙක් පුරප්පාඩු තනතුර පුරවා නොතිබුණි. | ව්‍යාපෘතිය තනතුර සඳහා සුදුසු පුද්ගලයකු බඳවා ගැනීමට සියළුම පියවරයන් ගනු ලැබූ අතර විවිධ හේතුන් නිසා එය අසාර්ථක විය. | ව්‍යාපෘතියේ කටයුතු පරිසරයට සංවේදී බැවින් මෙම අවශ්‍යතාවය අනිවාර්ය වේ. එම නිසා පරිසර නිලධාරියකු බඳවා ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

**3.5 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටලු**

| කාර්ය මණ්ඩල තනතුරු | තනතුරු ගණන | | | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | අනුමත | 2020 දෙසැම්බර් 31 දිනට තත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | |
| නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක | 02 | 01 | 01 | ව්‍යාපෘතියේ පුරප්පාඩු නොපිරවීම ව්‍යාපෘතියේ එදිනෙදා කටයුතු සඳහා අහිතකර ලෙස බලපාන බව සත්‍යයක් වේ. | සුදුසු කාර්යමණ්ඩලයක් සහිතව පුරප්පාඩු 19 පිරවීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) | 01 | - | 01 | | |
| ව්‍යාපෘති ඉංජිනේරු | 09 | 02 | 07 | | |
| පරිසර නිලධාරි | 01 | - | 01 | | |
| ව්‍යාපෘති ලේකම් | 02 | 01 | 01 | | |
| සහකාර ව්‍යාපෘති ඉංජිනේරු | 08 | 03 | 05 | | |
| කළමණාකාර සහකාර | 05 | 03 | 02 | | |
| ඉදිකිරීම් කළමණාකරු | 02 | 01 | 01 | | |
| | **30** | **11** | **19** | | |